# කටපාඩම් පද - 10 ශ්‍රේණිය

## බයිබල් පාඨ

1) සමිඳුනි, ඔබේ දෙව් මැදුරෙහි කවරෙකුට සිටිය හැක්කේද? ඔබේ ශුද්ධ කන්දේ කවරෙකුට විසිය හැක්කේද? - **ගීතාවලිය** 15:1

2) සමිඳාණෝ අනුකම්පාවෙන් හා දයාවෙන් පරිපුර්ණය; නොකිපෙන සුලුය, අතිශයින් කරුණාවන්තය - **ගීතාවලිය** 103:8

3) මාගේ සවි ශක්තිය වන සමිඳුනි,මම ඔබට ප්‍රේම කරමී - **ගීතාවලිය** 18:1

4) "ඔබ සියලු දෙනා ම පසුතැවී සිත් හරවා ගෙන පව්කමාව ලබන පිණිස ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් බව්තිස්ම ස්නාපනය ලබන්න, එවිට ඔබ ශුද්ධාත්ම දීමනාව ලබන්නහුය - **ක්‍රියා** 2:38

5) "ලෝකයේ ආලෝකය මම ය; මා අනුගමනය කරන්නා අඳුරෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේය" - **ජොහාන්** 8:12

6) සමිඳාණන් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. මක්නිසාද දිළිඳුන් හට සුබ ආරංචිය දේශනා කරනු වස්, උන් වහන්සේ මා ආලේප කළ සේක - **ලූක්** 4:18

7) එහෙත්, ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පැමිණි කල, ඔබ බලය ලබන්නහුය, එවිට ඔබ ජෙරුසලමෙහිද මුළු ජුදයෙහි හා සමාරියෙහිද පොළොවේ සීමාන්තයන් දක්වාද මාගේ සාක්ෂි කාරයෝ වන්නහුය - **ක්‍රියා** 1:8

8) ඉශ්රායෙල් ජනයෙනී, අපි ආසිරි ලද්දෙමු. දෙවිදාණන් කැමති දේ අපට පවසා ඇත - **බාරුක්** 4:4

9) හමු විය හැකි බැවින් සමිඳුන් සොයා යන්න; ළඟ ම සිටියදි එතුමන් අයැදින්න - **යෙසායා** 55:6

## නිසියානු විශ්වාස ලක්ෂණය

10) පියාණන් වහන්සේගෙන් හා පුත්‍රයාණන්වහන්සේගෙන් නික්මෙන සමිඳාණන් ද ජීවදායකයාණන් ද වූ ශුද්ධාත්මයාණන් වහන්සේ කෙරෙහි ද විශ්වාස කරමි. ඔවුන් වහන්සේ පියාණන් ද පුත්‍රයාණන් ද සමඟ එකම වන්දනාවත් මහිමයත් ලබන සේක. ඔවුන් වහන්සේ දිවැසිවරුන් මඟින් කථා කළ සේක - 8 **වගන්තිය**